දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 23/2015

PH/CF/CA/2/BUDGET/CIRCULARS/2015.

මුදල් අංශය,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2015-09-18

සියළුම කොමසාරිස්වරුන්,

සියළුම මාණ්ඩලික නිළධාරීන්,

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන්,

සියළුම අංශ ප්‍රධානීන්.

<u>බන්ධනාගාර ආයතන හා නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම හා බිල්පත් නිරවුල් කිරීම</u>

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 03/2014 හා 03/2014(I) යන චක්‍රලේඛයන් මගින් නිකුත් කොට ඇති විධිවිධානයන් යටතේ අදාල ගෙවීම් මෙම දෙපාර්තමේන්තුවට අනුකූල වන ආකාරයට සිදු කිරීම අරමුණු කොට මෙම ලිපිය නිකුත් කෙරේ.

02. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නව ප්‍රවණතාවයන් ඔස්සේ රාජ්‍ය සේවය වඩාත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා පහත වගුවේ සඳහන් සංශෝධිත මාසික උපරිම වියදම් සීමාවන් ඇතුලත බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන හා නිලධාරීන්ගේ සන්නිවේදන පහසුකම් සලසා දීමට තීරණය කර ඇත. මෙම නව සීමාවන් තීරණය කිරීමේදී දුරකථන සේවා ගාස්තු, දුරකථන ගාස්තු ඒකක මිල හා අන්තර්ජාල පහසුකම් ගාස්තු අඩු වීමද දැනට ඒ ඒ නිලධාරී කාන්ඩ වල සාමාන්‍ය සත්‍ය මාසික දුරකථන වියදම් ද සැලකිල්ලට ගෙන ඇත.

03. ඒ අනුව නිලධාරීන්ගේ රාජකාරි කාර්යාල දුරකථනය හා රාජකාරි පොදු අන්තර්ජාල බිල්පත් පමණක් පහත වගුවේ III (අ) ලෙස සඳහන් නිලධාරියාට හිමි උපරිම වියදම් සීමාව තුළ රජය විසින් ගෙවීමට කටයුතු කරන අතර නිලධාරියාගේ රාජකාරි නිවාස දුරකථනය, ජංගම දුරකථනය හා පෞද්ගලික අන්තර්ජාල සම්බන්ධතාවය සඳහා වන වියදම් නිලධාරියා විසින් පෞද්ගලිකව නිරවුල් කිරීම සඳහා පහත සඳහන් වගුවේ III (ආ) ලෙස සඳහන් පරිදි මාසික දීමනාවක් වැටුප සමග ගෙවනු ලැබේ.

| I කාණ්ඩ අංකය | II නිලධාරී කාණ්ඩය | III උපරිම වියදම් සීමාව (සියළු බදු හා මාසික ගාස්තු ඇතුලත්ව) රුපියල් | |
|---|---|---|---|
| | | (අ) රාජකාරි කාර්යාල දුරකථනය/ ෆැක්ස් සම්බන්ධතාවය සඳහා | (ආ) රාජකාරි නිවාස දුරකථනය/ජංගම දුරකථනය/අන්තර්ජාල සම්බන්ධතාවය සඳහා නිලධාරියාට ගෙවන දීමනාව |
| 01 | දෙපාර්තමේන්තු ප්‍රධානියා. | 6,000.00 | 8,000.00 |
| 02 | බන්ධනාගාර කොමසාරිස්/ අධ්‍යක්ෂ හා සම තත්වයේ නිලධාරීන්. | 4,000.00 | 5,000.00 |

| | | | |
|---|---|---|---|
| 03 | ජ්‍යෙෂ්ඨ බන්ධනාගාර අධිකාරී/ බන්ධනාගාර අධිකාරී/ නියෝජ්‍ය කොමසාරිස් හා සම තත්වයේ නිලධාරීන්. | 3,000.00 | 4,000.00 |
| 04 | සහකාර කොමසාරිස්/ සහකාර අධ්‍යක්ෂ/ සහකාර බන්ධනාගාර අධිකාරී හා සම තත්වයේ නිලධාරීන්. | 2,500.00 | 2,500.00 |
| 05 | පරිපාලන නිලධාරි | 2,000.00 | 2,000.00 |
| 06 | ප්‍රධාන ජේලර් | 2,500.00 | - |

04. ඩී02/විවිධ/01 හා 2015-08-25 දිනැති ලිපිය මගින් බන්ධනාගාර ආයතනයන්හි ප්‍රධාන ජේලර් වරයා හට දුරකථන පහසුකම් ලබා දීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ප්‍රධාන ජේලර් තනතුරේ වැඩ ආවරණය කරණු ලබන අවස්ථාවක දී වුවද අදාල දුරකථන බිල්පත් නිරවුල් කල හැකි අතර 2015-08-01 දින සිට මෙම ගෙවීම ක්‍රියාත්මක කෙරේ. ඒ යටතේ ප්‍රධාන ජේලර් වරයාගේ කාර්යාල දුරකථනය හා ජංගම දුරකථන බිල්පත් නිරවුල් කෙරෙන අතර ජංගම දුරකථන බිල්පත් නිරවුල් කිරිමේ සිමාව රුපියල් 1000.00 ක උපරිමයකටද යටත් විය යුතුය. මෙම අනුමැතිය යටතේ රුපියල් 2,500.00 ක සීමාව තුල කාර්යාල දුරකථනය හා ජංගම දුරකථන බිල්පත් නිරවුල් කල හැකි වන අතර දිමනාවක් ලෙස ගෙවීම් කල නොහැක. එමෙන්ම එම නිලධාරියාගේ ජංගම දුරකථන බිල්පත තමන්ගේ පෞද්ගලික මුදලින් ගෙවීමෙන් අනතුරුව පොදු 35 වවුචර් පතක් සමග බිල්පත ගෙවීම් කරණ ලද කුවිත්තාන්සිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාල මුදල ප්‍රතිපූර්ණය කිරිම හෝ බිල්පත් ඉදිරිපත්කල පසු කාර්යාලයෙන් ඉහත සිමාවට යටත්ව ගෙවීම හෝ සිදුකල හැකිය.

05. නව සන්නිවේදන තාක්ෂණය සමග රාජ්‍ය සේවය ද ඉදිරියට ගමන් කිරීමේ අභිලාශයෙන් බන්ධනාගාර ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීම සිදු කරන ලදි. නමුත් විවිධ ආයතන විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ලබා දෙනු ලබන කාර්යාල සඳහා යෝග්‍ය අන්තර්ජාල පැකේජය වන (Web Family - Rental Rs.1490) රාජකාරි කටයුතු වලට ප්‍රමාණවත් නොවන බවට කරුණු දැක්වුවත් එම පැකේජය රාජකාරි කටයුතු සඳහා වඩාත් යොග්‍ය හා ප්‍රමාණවත් බව අවධාරණය කරමි. ඒ අනුව බන්ධනාගාර ආයතනයන්හි අන්තර්ජාල අවශ්‍යතාවය එම ආයතනවල සන්නිවේදන පහසුකම් ලබා ගැනීමට අනුමැතිය හිමි නිලධාරීන්ගේ කාර්යාල දුරකථන සීමාව තුල කලමණාකරණය කර ගැනීමට කටයුතු කරන ලෙස තවදුරටත් දන්වමි.

06. මෙම සන්නිවේදන පහසුකම් සපයා ඇති කිසියම් නිලධාරියෙකු දුරකථන ක්‍රියාකරු මගින් ඇමුතුම් ලබාගෙන ඇත්නම් ඒ සඳහා ගාස්තු ද මෙම ලිපියේ 03 III (අ) හි දැක්වෙන නිලධාරියාගේ රාජකාරි කාර්යාල දුරකථන වියදම් සීමාව තුළ විය යුතු ය. දුරකථන ක්‍රියාකරු විසින් අදාල ඇමතුම් පිළිබඳ ලේඛණයක් පවත්වාගෙන යායුතු වේ. කාර්යාල දුරකථන වියදම් සීමාව ඉක්මවූ අවස්ථාවක රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2014 හි 03 (X) මගින් ලබා දී ඇති ප්‍රතිපාදන අනුව කටයුතු කල හැකි අතර ඒ යටතේ ද වියදම ආවරණය නොවන්නේ නම් නිලධාරියාගේ වැටුපෙන් අයකර රජයේ ආදායම් සංකේතාංක 20.03.02.99 යටතේ ගිණුම්ගත කල යුතුවේ.

07. තවද රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2014 හා 03/2014(I) යන චක්‍රලේඛයන් මගින් නිකුත් කොට ඇති විධිවිධානයන්ට අනුකූලව සන්නිවේදන පහසුකම් ලබා දීමට කටයුතු කිරීමට ක්‍රියාකල යුතු බව අවධාරණය කරමි.

එම්.බී.ආර්. පුෂ්පකුමාර,

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එම්.බී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

පිටපත :- විගණකාධිපති